**පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 2014**

-----------------------------------------------------------

පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල අතර 2014 ජනවාරි 30 දින එළඹි අංක 886 දරන ණය ගිවිසුමේ 1 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පළාත් 07 හි මං තීරු දෙකක් සමඟ පදික උරහිස් සහිත පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා වැඩිවන ඉල්ලුම සම්පූර්ණ කිරීමට හා වාහන මෙහෙයුම් හා මාර්ග නඩත්තු පිරිවැය, ගමන් වේලාව හා මාර්ග අනතුරු අවම කර ගැනීම මගින් අදාල ප්‍රදේශවල ආර්ථික හා සමාජ සංවර්ධනයට දායකවීම ව්‍යපෘතියෙන් අපේක්ෂිතය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 4,632 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 10 කි. සමස්ත පිරිවැය අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජනවාරි 30 ආරම්භ කළ අතර 2018 දෙසැම්බර් 31 අවසන් කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය

මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩි දියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ මුදල් ගලා ඒම් සහ ගලා යැම් මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ නිවැරදිව වෙන් කර දක්වා නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ගෙවන ලද වැටුප් රු. 336,416 ක් වැටුප් ගිණුම වෙනුවට සෘජුවම අග්‍රිම අරමුදල් ගිණුමට හර කර තිබුණි.

(ඇ) වෙනත් ව්‍යාපෘති කටයුතු වලට අදාල රු. 791,922 ක වක්‍ර පොදු කාර්ය වියදම් මෙම ව්‍යාපෘතියට අය කර තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දිනට |
| | කුවෙට් ඩිනාර් මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| අ.ආ.සං.කු.අ. | 10 | 4.632 | - | - | - |
| ශ්‍රී.ලං.ර | - | - | 4 | 4.858 | 7.796 |
| එකතුව | 10 | 4.632 | 4 | 4.858 | 7.796 |

**3.2 භෞතික ප්‍රගතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව,ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකින් බිම් කැබලි 65 ක් ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගැනීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු බිම් කැබැල්ලක් අත්පත් කර ගැනීමට ව්‍යාපෘතිය කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකයන් වැනි ප්‍රධාන කටයුතු සඳහා ව්‍යාපෘතිය විසින් සමස්ථ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද තත්‍ය ප්‍රගතිය සැලසුමට වඩා විශාල වශයෙන් පසුපසින් තිබුණි. 2014 සැප්තැම්බර් 23 දින පැකේජ- 01 යටතේ පිරි නැමීමට අපේක්ෂිත වූ කොන්ත්‍රාත්තුව දින 184 ක ප්‍රමාදයකින් පසු 2015 මාර්තු 26 දින පිරි නමා තිබුණි. උපදේශක කොන්ත්‍රාත්තුවද දින 369 ක ප්‍රමාදයකින් අනතුරුව පිරිනමා තිබුණු අතර උපදේශක සේවා ගිවිසුම 2020 අගෝස්තු 04 දක්වා දීර්ඝ කර තිබුණි.

(ඇ) 2014 අප්‍රේල් 29 වන දින සිට ණය සඳහා වූ මූල්‍ය ගිවිසුම බලපවත්වා ඇති වුවත්, ණය ලැබීම් 2015 ජූලි 20 දින වන විටත් භාවිතා කර නොතිබුණි. එම නිසා ව්‍යාපෘතියේ ඉතිරි කාලය තුළ සම්පූර්ණ ණය ලැබීම් උපයෝජනය කිරීමේ හැකියාව පිළිබඳ සැක සහිත විය.

**3.3 මතභේදයට තුඩු දෙන කරුණු**

2012 ජනවාරි 01 වෙනි දින ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ මූලික යෝජනාවේ ඇතුළත් පාලම් 08 ක් සවිකිරීමේ ස්ථාන 2014 ජනවාරි 30 දින ණය ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී සංශෝධනය කර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් මූලික යෝජනාවේ වෙනස්කම් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.